# විවේචනය තුළින් මතු කළ පුනරුදයේ දේශීයත්වය (අනගාරික ධර්මපාල චරිතය ඇසුරින්)

**නදීකා කුමුදිනී සිංහබාහු**[1]

*nadee19870312@gmail.com

දහවන සියවසේ දොන් ජුවන් ධර්මපාල, බුද්ධ ශාසනයත් සිංහල ජාතියත් විනාශ කළේය. එහෙත් දහනව වන සියවසේ බිහි වූ දොන් ඩේවිඩ් ධර්මපාල බුද්ධ ශාසනයත් සිංහල ජාතියත් උද්දීපනයට පත් කළේය'' වරක් යගිරල ශ්‍රී ප්‍රඥනන්ද හිමියන් ධර්මපාල උතුමාණන්ගේ ගුණ ගායනා කළේ එලෙසිනි. එහෙත් උපන් නමින් දොන් ඩේවිඩ් වුවද ''සිංහලයිනි නැගිටිව්'' යන අභීත හඬින් රට ජාතිය බේරා ගන්නට උපන් ජාතියේ පියාණන් ඒ පරගැති නමින් හැඳින්වීම යුතු නැත. සියවස් තුනකට ආසන්න කාලයක් විජාතික බලවේගයන්ගෙන් පීඩාවට පත් සිංහල ජාතියත් නිර්මල බුදු දහමත් රැකගන්නට ගත් මහා ප්‍රයාමයේ පතාක යෝධයෙකු වන්නේ දොන් ඩේවිඩ් නොව 'ශ්‍රීමත් අනගාරික ධර්මපාල''උතුමාණන්ය. දරුණු වාග් ප්‍රහාරයෙන් සිංහලයාට බැණ වදිමින් ඔවුන් අවසිහියෙන් මුදවා ගැනීමට මෙතුමා උත්සහ ගත් අතරම අවවාදයට වඩා ආදර්ශය තුළින් ම බෞද්ධ පුනරුදය තුළ දේශීයත්වය රෝපණය කිරීම මෙතුමාගෙන් සිදු වූ මහත් සේවාවකි. මේ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් වාග් ප්‍රහාර හා විවේචනය කොතෙක් දුරට පුනරුදයේ දේශීයත්වය ඉස්මතු කිරීමට දායක වූවේදැයි අධ්‍යයනය කිරීම මුඛ්‍ය අරමුණ විය. මෙහිදී අනගාරික ධර්මපාලතුමා පිළිබඳ ලිය වී ඇති මූලාශ්‍රය හා එතුමාණන්ගේ දේශන, සංවාද ඇතුළත් හඬ පට පරිශීලනය කෙරිණි. මාගේ උපකල්පනයට අනුව හදවතත්, මනසත්, දෑතත් සුසංයෝගයෙන් යම් කාර්යයක සාර්ථකත්වය නිර්මාණය කරයි. එබැවින් පුනරුද ව්‍යාපාරය සාර්ථක වීම කෙරෙහි මිෂනාරී විරෝධතා, බුදු දහමේ නැගී සිටීම් වැනි ක්‍රියා මෙන්ම සාමාන්‍ය වැසියාගේ ආධ්‍යාත්මික වෙනස්වීම, පුද්ගල සංවර්ධනය, මානසික ඒකාග්‍රතාව තුළින් ඇති කළ මානසික අභිප්‍රේරණය ද හේතු විය. අඩ සිහියෙන් සිටි සිංහලයා අවදි කළේ මෙතුමාගේ ආදර්ශමත් ජීවිතය හා පරගැත්තන්ගේ අනුකාරක ප්‍රතිපත්ති විවේචනය කරමින් ගෙන ගිය දරුණු හැසිරීමයි. ඒ අනුව පුනරුදයෙහි දේශීයත්වය අනගාරික ධර්මපාලතුමාගේ ක්‍රියාකාරීත්වයෙහි ප්‍රතිඵලයක් බව මෙහිලා මගේ නිගමනයයි.

මුඛ්‍ය පද ඃ අනගාරික, දේශීයත්වය, පුනරුදය, මිෂනාරී විරෝධතා